# අන්තර්පාරිවේණික භාෂා හා සාහිත්‍ය තරගය
උපදෙස් පත්‍රිකාව

## ධර්ම දේශනා තරගය

1. මෙම තරගය අංශ හතර සඳහා ම පැවැත්වේ. විනිශ්චය මණ්ඩලය මගින් නියම කරනු ලබන ධර්ම දේශනාවක් පුරාණ සම්ප්‍රදායානුකූල ලෙස විධිමත්ව ඉදිරිපත් කළ යුතු ය.

1.1. අභිමතාර්ථ

1. ධර්මදේශනා පැවැත්වීමේ කුසලතාව වර්ධනය කරගැනීමට හා සාම්ප්‍රදායික ක්‍රමවේදයන් ඉගෙනීමට පෙළඹවීම.
2. ~~තමන්ට ආවේණික වූ දේශනා විලාසයක් ගොඩනගාගෙන විචිත්‍ර ධර්ම දේශකයන් වහන්සේ~~ නමක් වීමට උනන්දු කරවීම.

1.2. තරග කොන්දේසි

1. විනිශ්චය මණ්ඩලය මගින් එම මොහොතේ ම ලබාදෙන තේමාවක් යටතේ ධර්ම දේශනය පැවැත්විය යුතු ය.
2. එක් තරඟකරුවෙකුට ලැබෙන කාලය විනාඩි 07කි.
3. වටාපතක් නියමිත පරිදි අල්වාගෙන ධර්ම දේශනය පැවැත්වීමට තරඟකරුවන්ට සිදුවේ. -
   - I. පැන් වැඩීමේ අනුශාසනාවක්
   - II. මතක ධර්ම දේශනයක්
   - III. පාංශුකූල දේශනයක්
   - IV. බුද්ධ පූජාව පැවැත්වීමෙන් පසු කෙරෙන අනුශාසනාවක්.
   - V. භුක්තානුමෝදනාවක් (දානය වැළඳීමට පසු කෙරෙන අනුශාසනාවක්)
   - VI. පිරිත් අනුශාසනාවක්

1.3. ලකුණු ලබාදීමේ ක්‍රමය

| | | |
|---|---|---|
| 1. | දේශනා විලාසය | 10 |
| 2. | කරුණුවල සාරවත් බව | 10 |
| 3. | සාම්ප්‍රදායානුකූල බව | 10 |
| 4. | වටාපත නිවැරදිව අල්ලා ගැනීම | 10 |
| 5. | සර්ජනය | 10 |
| | මුළු ලකුණු | 50 |